**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2013**

**-----------------------------------------------------------**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ , ලාභ හා පාඩු සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ගිණුම් ප්‍රමිත අංක 16 | (i) දේපළ පිරියත උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීමේදී වත්කම් භාවිතය සඳහා යෝග්‍ය තත්ත්වයට පත්කල |

දිනසිට ක්ෂය කළ යුතු වුවද, කොමිෂන් සභාව විසින් වත්කම් මිලදී ගැනීමේදී සම්පූර්ණ වර්ෂය වෙනුවෙන්ද, ඉවත්කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේද ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි.

(ii) කොමිෂන් සභාවට අයත්ව තිබූ අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් - කටාන විසින් අත්පත් කරගෙන තිබුණු අතර සම්පූර්ණ ඉඩමේ වටිනාකම රු. 45,000,000 ක් වශයෙන් දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි. වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වුවත් පසුගිය වර්ෂ 11 තුළ මෙය ගිණුම් සටහනක් මගින් පමණක් පෙන්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන පිරිවැය රු. 399,451,975 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ශූන්‍ය අගය මත ගිණුම් ගතකර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී රු. 130,544,231 ක් වටිනා ඉන්වොයිස් පෙර වර්ෂය වෙනුවෙන් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සංඛ්‍යාත බලපත්‍ර ආදායම රු. 130,544,231 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය රු. 2,367,160 ක් හා උසාවි නඩුවලින් ආපසු අයකර ගැනීම් රු. 630,000 ක් වෙනත් ආදායම් සඳහා වූ සටහනේ දක්වා තිබුණද එය ආදායම් ප්‍රකාශයේ ආදායමට එකතු නොකර වර්ෂය සඳහා විස්තීරණ ආදායමට එකතුකර පෙන්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවෙහි වෙළඳ ණයගැතියන් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුදලින් රු. 365,254,867 ක මුදලක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂයන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද, වර්ෂ 20 කට වැඩි කාල වකවානුවක සිට පැවතෙන ණය ශේෂයන්ද ඒ අතර විය.

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු. 105,727,789 ක් අයවිය යුතුව තිබූ අතර සැපයූ සේවා සඳහා 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් ඉන්වොයිස් නිකුත්කර නොතිබුණි. තවද රු. මිලියන 01 ට වැඩි ණයගැතියන් 11 දෙනෙකුගෙන් වර්ෂ 2 ත් වර්ෂ 14 ත් කාලයක සිට රු.224,805,159 ක් අයවිය යුතුව තිබූ නමුත් එම ණයගැතියන් වෙත වර්ෂ ගණනාවක් සඳහා ඉන්වොයිස් නිකුත්කර නොතිබුණි.

(ඇ) සංඛ්‍යාත පරිහරණය කරනු ලබන ආයතන 34 විසින් වර්ෂ 02 කට වැඩි කාලයකට පෙර ගෙවිය යුතු මුදල් ඉක්මවා රු.1,640,929 ක් ගෙවීම් සිදුකර ඇතත් එම ගෙවීම් නිරවුල් කිරීමට මෙතෙක් කොමිෂන් සභාව විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(ඈ) වර්ෂ 01 ට වැඩි අයනොවි පවතින සේවක ණය ශේෂය රු. 2,461,764 ක් විය.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් විගණනයේදී අනාවරණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2000 ජූනි 27 දිනැති පීඑෆ්/පීඊ/09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2011 ජනවාරි 27 දිනැති පීඊ අංක 56 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | මුදල් ආයෝජනය කිරීම හා මුදල් රඳවා ගැනීම සම්බන්ධයෙන් ලබාගත යුතු අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් රු. 18,524,500,000 ක මුදලක් බැංකුවක ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ

| | | |
|---|---|---|
| i. xxiv පරිච්ඡේදයේ උපවගන්තිය | 7.9.2 | නිලධාරියාගේ දීමනා රහිත වැටුපෙන් මුළු අඩුකිරීම් වල සියයට 40 ක සීමාව තුල ණය මුදල නිර්දේශ කළ යුතු වුවත් අධ්‍යක්ෂ (ජාල) වෙත වැටුපෙන් මුළු අඩුකිරීම්වල එකතුව සියයට 40 සීමාව ඉක්මවා තිබියදී වාහන ණය මුදලක් අනුමත කර ගෙවීම් කර තිබුණි. |
| ii. xxiv පරිච්ඡේදයේ උපවගන්තිය | 7.2.5 | අධ්‍යක්ෂ (ජාල) විසින් වාහනයක් මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී රු. 1,500,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණද එම මුදලින් වාහනයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. එම මුදල 2011 මාර්තු මාසය දක්වාම පෞද්ගලිකව පරිහරණය කොට ඒ දක්වා ගෙවීමට තිබූ මුළු ණය හා පොලිය රු. 865,358 ක් කොමිෂන් සභාව වෙත පියවා රු. 2,100,000 ක වාහන ණය මුදලක් නැවත ලබාගෙන තිබුණි.<br><br>වාහන ණය මුදලක් ලබාගත හැක්කේ වසර 05 කට වරක් පමණක් වන නමුත් මෙම නිලධාරියා 2011 වර්ෂයේදී ලබාගත් ණය මුදල 2013 වර්ෂයේදී පියවා, 2013 ජූලි මාසයේදී රු. 2,260,000 ක ණය මුදලක් නැවත ලබාගෙන තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

-------------------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 757(2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයේ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වත්කම් සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 1990 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය | රාජ්‍ය සංස්ථා, රජයේ ආයතන, වෙළඳ ව්‍යාපාර සහ මහජන සමාගම්වල සියළු නෛතික වැඩ කටයුතු සම්බන්ධයෙන් සේවාවන් නීතිපතිවරයා විසින් ඉටුකළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණද එක් අවස්ථාවකදී කොමිෂන් සභාව එසේ කටයුතු නොකොට පෞද්ගලික ආයතනයක් නීති ආයතනය ලෙස තෝරාගෙන ඒ වෙනුවෙන් 2013 සැප්තැම්බර් 13 දින වනවිට රු. 242,130 ක් ගෙවීම්කර තිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2007 ජූනි 12 දිනැති හා අංක 15/2007 දරන චක්‍රලේඛය | වාහන ණය ගෙවීම වානිජ බැංකු හරහා සිදුකළ යුතු බව දන්වා ඇතත් කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 14 දිනැති අංක TRC/04/12 දරන චක්‍රලේඛය පාදක කරගෙන කොමිෂන් සභාවේ මුදල්වලින් වාහන ණය ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | (i) 2007 ජූනි 12 දිනැති හා අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.2 (ආ) අනුව හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 7.4.1 උප වගන්තිය | වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීම් නොකොට සියයට 4.2 ක වාර්ෂික පොලියක් පමණක් කොමිෂන් සභාව විසින් අයකරගෙන තිබුණි. |
| | (ii) 1998 මාර්තු 18 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වෙළඳපොලේ පවතින පොලී අනුපාතය අනුව ණය සඳහා පොලී අයකර ගත යුතු අතර අඩුවෙන් අයකර ගෙන ඇති පොලී මුදල් ගණනය කර කොමිෂන් සභා ගිණුම්වලට ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (උ) | 1999 ජනවාරි 06 දිනැති අංක 81 දරන ජාතික අයවැය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් රු. 39,800,000 ක් වැය කොට ජීප් රථ 02 ක් මිලදී ගැනීමේදී භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඌ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| i. 4.1.1 වගන්තිය | මිලදී ගැනීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පැවතිය යුතුයි යන්න දක්වා ඇතත් දත්ත ගබඩා කිරීමේ යන්ත්‍ර 05 ක්, ආරක්ෂිත මෘදුකාංගයක්, දත්ත ගබඩා කිරීමේ රාක්කයක් හා LCD මොනිටර් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. මෙම ගනුදෙනුවේ ප්‍රසම්පාදන කටයුතු 2012 වර්ෂයේදි නිම කිරීමට සැලසුම් කර තිබුණද එසේ කිරීමට නොහැකිවීම නිසා 2013 වර්ෂයේදී මිලදී ගැනීම් සිදුකර අළුත්වැඩියාකිරීම් හා නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| ii. 8.9.1 (අ) වගන්තිය | භාණ්ඩ සැපයීමේදී රු 500,000 ට වැඩි මිලදී ගැනීම් සඳහා අදාල සැපයුම් සමාගම සමග ගිවිසුමකට එළඹිය යුතු වුවද , දත්ත ගබඩා කිරීමේ යන්ත්‍ර 05 රු. 3,478,013 කටද ආරක්ෂිත මෘදුකාංගය රු. 841,574 කට මිලදී ගැනීමේදී එසේ ගිවිසුම්වලට එළඹී නොතිබුණි. මේ නිසා කාල ප්‍රමාදයක් සහිතව උපකරණ සපයා තිබුණද සැපයීම් ප්‍රමාදයන් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| iii. 3.5 වගන්තිය | ජීප් රථ 02 ක් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණි. |
| iv. 2.8 හා 3.3 වගන්ති | ශාරීරික සුවතා මධ්‍යස්ථානය සඳහා රු. 5,115,465 කට උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණ අතර මිලදී ගැනීම සඳහා ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීම් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (එ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2011 දෙසැම්බර් 30 දිනැති අංක බීඩී/සීපීබී/1/1/2012 හි 04 ඡේදය | සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රුපියල් දෙලක්ෂ පනස් දහසක උපරිමයකට සීමා කළ යුතු වුවත් අවස්ථා 13 ක දී එම සීමාව ඉක්මවා රු.1,890,040 ක් ගෙවා තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2007 ජූනි 13 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියෙන් පැහැදිලිව දක්වා තිබුණු පරිදි අදාල ආයතනය විසින් තම සේවකයන් වෙනුවෙන් නිවාස කුලී දීමනා ලෙස වැටුපෙන් සියයට 10 ක් ගෙවීම සඳහා නිර්දේශය ලබාදී නොතිබියදීත්, එම විධිවිධානවලට පටහැනිව කොමිෂන් සභාව විසින් එහි සේවකයින් වෙනුවෙන් නිවාස කුලී දීමනා වශයෙන් රු. 7,555,959 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ සේවකයින් බැංකුවෙන් ලබාගත් නිවාස ණය සඳහා වූ පොළියෙන් 2/3 ක් වූ රු. 3,486,312 ක් 2013 වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂම් සභාව විසින් ගෙවා තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39, 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE/05 හා 1994 ජූනි 04 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 ට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුව කාර්යය මණ්ඩලය වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) 2012 වර්ෂයේ පැමිණීමේ දීමනාව ලෙස රු. 3,341,995 ක්

(ii) සමාලෝචිත වර්ෂයේ දුරකථන දීමනාව ලෙස රු. 1,763,533 ක්

(iii) ජීඑස්ආර් ව්‍යාපෘතියෙහි රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් නිලධාරීන් 32 දෙනෙකු සඳහා රු. 547,500 ක්

(iv) 2012 වර්ෂයේ ප්‍රසාද දීමනාව ලෙස රු. 4,103,890 ක්

(ඈ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2007 ජූනි 01 දිනැති හා අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියේ සඳහන් කරුණුවලට පටහැනිව කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) ඉහත ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය සඳහා රු. 2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද මාසිකව රු. 6,000 බැගින් ප්‍රවාහන දීමනාවක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා අනුමැතියෙන් තොරව රු.5,328,000 ක් ගෙවීම.

(ii) තවද ඉහත ලිපියෙන් කොමිෂන් සභා නිලධාරීන්ගේ මාසික ඉන්ධන වියදම් දීමනාව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුට රු.5,000 ක් හා සහකාර අධ්‍යක්ෂවරයෙකුට රු. 3,500 කට සීමාකර තිබුණද එම සීමා නොසලකා නියෝජ්‍ය අධ්‍යක්ෂක හා සහකාර අධ්‍යක්ෂකවරුන් සඳහා මාසික ඉන්ධන දීමනා ලෙස පිළිවෙලින් රු. 17,000 හා රු. 15,500 ක් බැගින් ඉන්ධන දීමනා ගෙවීම් කර තිබුණි. ඒ අනුව අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.2,268,000 ක් ගෙවීම.

(ඉ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි සඳහන් පරිදි 2009 මාර්තු 18 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව 2013 අගෝස්තු 15 දිනැති කොමිෂන් සභා තීරණය අනුව සේවක කාණ්ඩවලට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප්තල සංශෝධනය කර ඉහළ වැටුප් ක්‍රමයක් සකස්කර වැටුප් ගෙවීම් කර තිබුණි. මෙය ජාතික වැටුප් ප්‍රතිපත්තියට පටහැනි වන අතර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් ඒ ඒ වැටුප් කාණ්ඩවලට අනුමත කර ඇති වැටුප්තල පරිමාණයන් අභිබවා යාමකි. සමාලෝචිත වර්ෂයට අදාලව වැඩිපුර ගෙවා ඇති වැටුප් ප්‍රමාණය රු. 18,284,450 ක් විය.

(ඊ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකුගේ වැටුප් තීරණය කිරීමේදී 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 හි විධිවිධාන සැලකිල්ලට ගෙන නොතිබුණි.

03. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු. 47,367,276,561 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 37,684,009,841 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 9,683,266,720 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවෙහි ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැළකිය යුතු විචලනයන් පහත පරිදි නිරීක්ෂණය විය.

| විස්තරය | 2013.12.31 | 2012.12.31 | වෙනස | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| **ආදායම්** | | | | |
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 2,060,743,487 | 1,418,317,869 | 642,425,618 | 45.3 |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | 8,226,962,705 | 6,532,360,699 | 1,694,602,006 | 26 |
| සංඛ්‍යාත ගාස්තු ඉදිරි ගෙවීම් | 5,661,038,940 | 367,346,939 | 5,293,692,001 | 1441.1 |
| රැහැන් රහිත දුරකථන ගාස්තු | 24,910,893 | 20,054,795 | 4,856,098 | 24.2 |
| විවිධ ආදායම් | 1,991,028,937 | 826,946,847 | 1,164,082,090 | 140.77 |
| මුළු ආදායම | 49,202,055,538 | 38,603,814,047 | 10,598,241,491 | 27.45 |
| **වියදම්** | | | | |
| නියාමන වියදම් | 870,579,295 | 272,988,566 | 597,590,729 | 219 |
| බොල් ණය | 83,367,539 | 5,783,816 | 77,583,723 | 1341.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 421,995,689 | 227,945,588 | 194,050,101 | 85.1 |
| මුළු වියදම | 1,834,778,977 | 919,804,206 | 914,974,771 | 99.3 |
| වර්ෂයේ බදු පෙර මෙහෙයුම් ලාභය | 47,367,276,561 | 37,684,009,841 | 9,683,266,720 | 25.7 |

04. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

4.1 කාර්ය සාධනය
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් සංඛ්‍යාත භාවිතය විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී සංඛ්‍යාත දෝෂ සම්බන්ධ මහජන පැමිණිලි 45 ක් ලැබී තිබුණි.

(ආ) සංඛ්‍යාත භාවිතා කිරීම සඳහා යොදාගන්නා උපකරණ වැඩසටහන්ගත කිරීමට (Programe) පෞද්ගලික ආයතන වෙත අවස්ථාව සලසා තිබුණි. මේ හේතුවෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබා දී ඇති බලය (Power) ඉක්මවා වඩා වැඩිපුර භාවිතා කිරීමට හැකියාව ඇතිවනවා මෙන්ම ඉඩදී ඇති අවස්ථාවන්ට වැඩියෙන් තමන්ට අවශ්‍ය පරිදි වැඩිපුර උපකරණ සංඛ්‍යාවක් වැඩසටහන් ගතකර ගත හැකි බව නිරීක්ෂණය විය. එම අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කොමිෂන් සභාව මැදිහත් වී නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇතැම් ආයතන සිය විගණිත අවසාන ගිණුම් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් කොමිෂන් සභාව වෙත ලැබිය යුතු මුදල කොපමණද යන්න නිශ්චිතව තහවුරු කරගැනීමට ප්‍රමාද වී තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති 1986/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව 2011 ජනවාරි 01 දින සිට විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් සෙස් බදු ගෙවිය යුතු වුවද, ආයතන 5 ක 2014 අප්‍රේල් 25 දින වනවිට හිඟව පැවති මුළු සෙස් බදු මුදල රු. 50,876,397 ක් විය. සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයක් කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබීම හේතුවෙන් විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් අයකරන ලද සෙස් බදු මුදල් කොමිෂන් සභාව වෙත ගෙවීම පැහැර හැර තිබුණි. සැම බලපත්‍රලාභියෙකුටම අදාල වන පරිදි නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයක් විදුලි සංදේශ පනතට ඇතුළත් කිරීමට කටයුතු කරන බව 2011 ජුනි 28 දින හා 2012 ජුනි 16 දිනයන්හි මා වෙත දන්වා ඇතත් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් සංඛ්‍යාත ගාස්තු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවන්හිදී දඩ මුදල් අයකර

ගැනීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිසි ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දී නොතිබුණි. 2013 වර්ෂයේ නිකුත් කරන ලද ඉන්වොයිස් අතරින් රු.4,133,666 වටිනා ඉන්වොයිස් සඳහා 2014 වර්ෂයේ අප්‍රේල් 29 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි. තවද අදාල ආයතන වෙත ඉන්වොයිස් නිකුත් කිරීමේ කාල ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් පසුගිය වර්ෂවලට අදාලව අයවිය යුතුව පැවති රු. 130,544,231 ක ආදායම් සඳහා ප්‍රවර්තන වර්ෂයේදී ඉන්වොයිස් නිකුත් කර තිබුණි.

(ඈ) රේඩියෝ සංඛ්‍යාත ගාස්තු පැහැර හැරීම සම්බන්ධයෙන් අතිරේක දඩ මුදලක් අයකර ගැනීමට විදුලි සංදේශ පනත මගින් කොමිෂන් සභාවට බලයක් ලැබී නොමැති හෙයින් ඒ පිළිබඳව නීතිමය බලය ලබාගැනීම සඳහා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1991 අංක 25 දරන හා 1996 අංක 27 දරන සංශෝධිත ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(1) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කරන ලද බලපත්‍රයක් යටතේ හැර කිසියම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පාවිච්චි නොකළ යුතුය. කෙසේ වුවද එක් සමාගමක් බලපත්‍රයක් රහිතව සංඛ්‍යාත පාවිච්චි කර තිබුණද එයට එරෙහිව කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත අනුව විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් සියයට 20 ක් වූ විදුලි සංදේශ බදු එකතුකර පසු මාසයේ 15 දිනට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වුවද ආයතන 02 විසින් එපරිදි ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2012 වර්ෂය සඳහා විදුලි සංදේශ බදු ගෙවන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ගිණුම් වාර්තා විගණකවරුන් විසින් සහතික කර නොතිබුණ අතර ආයතන 02ක් විසින් 2012 වර්ෂය සඳහා අවසාන ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. කොමිෂන් සභාව විසින් එම අවසන් ගිණුම ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වර්ෂයට අදාල බදු මුදලේ නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ඌ) මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අළුත්කිරීම කළයුතු දිනය පසුවී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණද සන්නිවේදන ක්‍රියාකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 101 ක් වූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවලට අනුව උපයනවිට ගෙවීම මත බදු අදාල නිලධාරීන්ගෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු වුවද, නිලධාරීන්ගෙන් අඩුකර ගැනීමකින් තොරව එකතුව රු. 3,512,759 ක උපයන විට බදු කොමිෂන් සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

4.3 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

සමාලෝචිත වර්ෂයේ කාර්යය මණ්ඩල නිලධාරීන්ගේ පවුල්වල සුහද හමුව හා චාරිකාවක් සඳහා නවාතැන් හා ආහාරපාන වෙනුවෙන් රු. 5,091,903 ක වියදමක් කොමිෂන් සභාව විසින් දරා තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2003 වර්ෂයේ ඉතිරි කිරීමේ බැංකු ගිණුමක තැන්පත් කරන ලද ඇමරිකන් ඩොලර් 420,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇමරිකන් ඩොලර් 532,111.45 ක් හෙවත් රු. 69,605,498.77 දක්වා වර්ධනය වී ඇතත් එම මුදල් පසුගිය වසර 10 ½ ඇතුළත කිසිදු උපයෝජනයකින් තොරව පවත්වා තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාර අරමුදලෙහි තැන්පත් කර තිබුණු මුදලින් රු. 8,000,000,000 ක මුදලක් කල්පිරීමට පෙර මහා භාණ්ඩාගාරය විසින් වට්ටම් කිරීම නිසා ඉතිරි ආයෝජන මුදල වූ රු. 285,642,376 ක් හා රු. 325,812,879 ක් ලැබිය යුතු ලාභාංශ ආදායම අහිමි වී තිබුණි.

(ආ) 2012 පෙබරවාරි 29 දිනය දක්වා කොමිෂන් සභාව සතු වාහනයක් අමාත්‍යවරයකු විසින් පාවිච්චි කර තිබූ අතර එම කාලය තුලදී සිදුවූ රිය අනතුරකින් අලාභානි සිදුවී තිබුණි. වාහනය අළුත්වැඩියාව සඳහා රු. 625,409 ක මුදලක් කොමිෂන් සභාව විසින් දරා තිබුණද රු. 452,377 ක් පමණක් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූරණය කිරීම හේතුවෙන් කොමිෂන් සභාවට රු. 173,031 ක අලාභයක් සිදුවී තිබුණි. මෙම අලාභය ඊට වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

නෙළුම් කුළුණ - බහු සම්ප්‍රේෂණ රූපවාහිනී සහ විදුලි සංදේශ කුළුණ ඉදිකිරීම

--------------------------------------------------------------------------------------

(අ) මෙම ඉදිකිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත චීන සමාගමක් වෙත ලබාදී තිබුණද එම සමාගමේ ව්‍යාපාර බලපත්‍රයට අනුව සමාගමේ ව්‍යාපාරික විෂය පථයට බහු සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම් හෝ විශාල පරිමාණයේ කොන්ත්‍රාත්තු ඉදිකිරීම් ඇතුළත් වී නොතිබුණි.

(ආ) ඉදිකිරීම් සිදුකරන කාල වකවානු හා ඊට අදාල නිමකළ යුතු වැඩ කොටස් දැක්වෙන Criticle Path ඉදිරිපත් කර තිබුණද ගතවී තිබූ මාස 17 ට අදාලව ඉදිකිරීම් ප්‍රගතිය භෞතික හා මූල්‍ය වශයෙන් ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය. ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව දින 912 කින් නිම කළ යුතු බැවින් අපේක්ෂිත පරිදි නිමකළ යුතු දිනට කාර්යය නිමකිරීමට ඇති හැකියාව පරීක්ෂා කර බැලීමට නොහැකි විය.

(ඇ) වැඩ නිම කළ යුතු කාලය සියයට 55 කට වඩා ගතවී තිබුණද මෙකී කාලය තුල කොන්ත්‍රාත් පිරිවැයට වන වෙනස්වීම් පිළිබඳව වාර්තාවක් උපදේශක සමාගම සකසා නොතිබුණි.

(ඈ) ගිවිසුම් ප්‍රකාරව සටහන් 'සී' හි සඳහන් පරිදි ගිවිසුම් අත්සන් කොට මාස 05 ක් ඇතුළත විස්තරාත්මක ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර තිබිය යුතු වුවත් මාස 17 ක් ගතවී තිබුණද එවැනි විස්තරාත්මක ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර නොතිබුණි.

4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

---

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක්සේ සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාල ඉඩම සඳහා දැනට වැයකර ඇති පිරිවැය පමණක් අයකර ගැනීමේ පදනම මත, එම ඉඩම එකී අධිකාරිය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා දිය යුතු බවට 2011 දෙසැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එයට පටහැනිව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩමට වැයකර ඇති පිරිවැය ගණනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයේදී නාගරික සංවර්ධන අධිකාරියට රු. මිලියන 1,800 ක් ගෙවා තිබුණ අතර තවත් රු. මිලියන 9,900 ක් ගෙවීමට එකඟ වී තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

---

2013 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 290 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 207 ක් පමණක් විය. කොන්ත්‍රාත් පදනම මත හා ද්විතීයන පදනම මත සේවකයන් 29 ක් කාර්යය මණ්ඩල සඳහා බඳවාගෙන තිබුණද, ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. විස්තර පහතින් දැක්වේ.

| සේවක වර්ගය | 2013.12.31 දිනට සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | අතිරික්ත තනතුරු |
|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | | |
| විධායක/ මාණ්ඩලික ශ්‍රේණි | 62 | 28 | 34 | - |
| සහයක | 182 | 109 | 73 | - |
| සුළු සේවක | 46 | 41 | 05 | - |
| ද්විතීයන පදනම මත | - | 02 | - | 02 |
| කොන්ත්‍රාත් පදනම මත | - | 27 | - | 27 |
| | 290 | 207 | 112 | 29 |

4.9 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නෙළුම් කුළුණ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් අධීක්ෂණ නිලධාරී වෙනුවෙන් මසකට රු. 80,000 ක මුදලකට කුලී පදනම මත ලබාගෙන තිබූ වාහන සඳහා 2004 අගෝස්තු 31 දිනැති අංක 353/(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව දෛනික ධාවන සටහන් ලියා නොතිබුණි.

(ආ) ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාල වාහනය සේවයට යොදවා ගැනීම පිළිබඳව හා ධාවනය කල කි.මී. ප්‍රමාණය, ධාවනය කළ දින ගණන යනාදිය තහවුරු කිරීමට නොහැකි වීමෙන් මෙම වාහනය කුලියට ගැනීමේ යෝග්‍යතාවය තහවුරු කිරීමට නොහැකි විය.

05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009- 2013 වර්ෂ සඳහා සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම සංශෝධනය කර නොමැති අතර දැනට පවතින සංයුක්ත සැලැස්මෙහි මානව සම්පත් පරිපාලනය, මූල්‍ය හා සැපයුම් යන අංශයන්හි ප්‍රතිපත්ති ක්‍රමවේදයන් කවරේද යන්න හා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු කවරේද, එම කටයුතු කවුරුන් වෙනුවෙන් කුමන කාලයක කෙසේ එය සිදු කෙරේද යන්න ඇතුළත්ව නොතිබුණි. පසුගිය වසර 03 ක මෙහෙයුම් කටයුතු සමාලෝචනය කර එහි අන්තර්ගත කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මක් හා අයවැය

ලේඛනය අතර සම්බන්ධයන් ගොඩනැගෙන අයුරින් කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමට හැකිවන අයුරින් යථෝක්ත සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) 2000-2001 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත රු. 22,231,205 ක මුදලක් ගෙවා තිබුණද පිළිගත හැකි ආකාරයකට සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් පවත්වන බව දක්වා තිබුණත් එහි ප්‍රගතියක් නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

වර්ෂය ආරම්භවීමට ප්‍රථම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සකසන ලද ඉලක්කයන් ලඟාකර ගැනීමට කටයුතු කිරීම හා නිශ්චිත කාල වකවානුවක් තුළ කොතෙක් දුරට සැලසුම් ගත ඉලක්කයන් ලඟාකර ගත්තාද යන්න සලකා බැලිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකසා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදනය සැලසුම් සහගත අයුරින් සිදු නොකිරීම හේතුවෙන් එය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද අයවැය පුරෝකථනයන් තත්‍ය අගයන් සමග සැසඳීමේදී බොහෝ විචලනයන්ගෙන් යුක්ත බව නිරීක්ෂණය විය. එම විචලනය සියයට 4 සිට සියයට 124 දක්වා පරාසයක් තුළ විහිදී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් නිවැරදි අයුරින් පුරෝකථනය සිදුවී නොතිබූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය කරනු ලැබේ.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ මෙතෙක් සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණයන් මුදල් පනතේ 13(7)ඒ වගන්තිය ප්‍රකාරව මාගේ විස්තරාත්මක වාර්තාව මගින් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය

(ආ) සංයුක්ත සැලැස්ම

(ඇ) ණයගැතියෝ

(ඈ) ආයෝජන

(ඉ) ප්‍රසම්පාදන

(ඊ) දීමනා ගෙවීම්

(උ) කොන්ත්‍රාත් පාලනය